# රහස් පුස්තකයේ අභිරහස

*පිටු අතර සැඟවුණු අභිරහස සොයා’*



**තුමාෂා ශමින්දි ජයසේකර**

# රහස් පුස්තකයේ

# අභිරහස

තුමාෂා ශමින්දි ජයසේකර

# රහස් පුස්තකයේ අභිරහස

## තුමාෂා ශමින්දි ජයසේකර

**ISBN** 978-624-206-660-8

**කතෘගේ වෙනත් කෘති**

- හොඳ යාළුවෝ
- උපකාරය
- පුංචි නුවණට පුංචි කවි ගී
- දේදුනු කන්ද
- සමනලීගේ පැන්සල
- වනන්තරේ මිතුදම
- පුංචි කුමාරිකාවෝ

2023 . 11 . 15

# ~ පිදුම ~

සෙවණැල්ලක් සේ නිරතුරුව ම මා සමග සිටිමින් මට ශක්තිය ධෛර්ය ලබා දෙන මාගේ දෙමාපියන්ට හා නැන්දාටත්, කුඩා කළ පටන් මා සිප් නැණින් ඔපවත් කළ ගුරු මෑණිවරුන්ට හා ගුරු පියවරුන්ටත්, සෑම විටම මා හා එක්ව සිටින මාගේ ආදරණීය මිතුරියන්ටත්, වචනයකින් උපකාර කළ සියලු දෙනාටත් මෙම කෘතිය සෙනෙහසින් පුදමි !

# පෙරවදන

වත්මන් අධ්‍යාපනයෙන් ඵලදායි පුරවැසියෙකු සතුටින් ජීවත්වන පවුලක් මෙන් ම ප්‍රඥාසම්පන්න දැනුමෙන් යුත් බහුවිධ කුසලතාවන්ගෙන් සපිරි පුරවැසියන් සහිත සමාජයක් ගොඩ නැගීම අපේක්ෂාව යි. එසේ නම් පාසලට වගකීම් පවරන දරුවාගේ විභවතා හඳුනාජෙන ඒවා ඔපවත්කිරීම තුළින් ගෝලීය සමාජයට ගැළපෙන ලෙස හැඩගැස්වීම අපගේ වගකීමයි. එම ජාතික අරමුණු මෙන්ම පාසලේ දර්ශනයට අනුව යමින් අපගේ මගපෙන්වීම යටතේ ලේඛනකරණය සහජයෙන් උරුමකරගත් මහාමායා දියණියන් වසර ගණනාවක් සිට විවිධ අරමුණු පෙරදැරිකොට ගෙන ග්‍රන්ථකරණයට යොමුකිරීමේ ප්‍රතිඵලයක් ලෙස දේශීය සාහිත්‍ය කෙතේ ලේඛක අංකුර දහස් ගණනක් වැපිරීමට ලැබීම පාසලක් වශයෙන් ලැබූ සුවිශේෂ ජයග්‍රහණයක් මෙන්ම කාලීන ජාතික අවශ්‍යතාවයක් සපුරාලීමකි.

එහි ඉදිරි දිගුවක් ලෙස පාසල තුළ ගොඩනැගී ඇති පොත් ලිවීමේ සංස්කෘතිය මෙවර ඩිජිටල් තාක්ෂණික යුගයේ ස්මාර්ට් දරුවනට ගැළපෙන ලෙස නවීකරණයකරමින් "දිවිය දිනන විද්‍යුත් පොතක්" ව්‍යාපෘතිය හඳුන්වාදෙන ලදී. දරුවන්ට අත්දැකීම් සමුදායක් මෙන්ම ගත්කතුවරයෙකුවීම හරහා ජීවිතයට එකතුවන වටිනාකම සළකා අධ්‍යාපන අමාත්‍යංශ අනුමැතියෙන් රටේ ම පාසල් දරුවන් අතර විද්‍යුත් පොතක් ලියන්නට සිහින දකින දරුවන් සහෝදරත්වයෙන් අප හා එක්වීම අගය කරමි.

2023 සාහිත්‍ය මාසයට සමගාමී ව අප පාසල විසින් සංවිධානය ක "දිවිය දිනන විද්‍යුත් පොතක්" ව්‍යාපෘතියට එක්වූ පුංචි ලේඛක ලේඛිකාවන්ට මෙම කෘතිය තුළින් ලැබුණු අත්දැකීම් ඉදිරි අධ්‍යාපනයට මෙන්ම අනාගත දිවියට ශක්තියක් වේවා යි ප්‍රාර්ථනා කරමු.

මෙම ව්‍යාපෘතිය වෙනුවෙන් සහාය දැක්වූ අප පාසලේ කලමනාකරණ මණ්ඩලය ගුරුභවතුන් දෙමාපියන් ආදි ශිෂ්‍යාවන් සෙසු පාසල් වල දරුවන් යොමුකළ විදුහල්පතිවරුන් ගුරුභවතුන් මෙන්ම නන් අයුරින් උදව් උපකාර කළ සැමට හෘදයාංගම ස්තුතිය මෙමගින් පිරිනමමි.

ශෂිකලා සේනාධීර

විදුහල්පතිනිය

මහාමායා බාලිකා විද්‍යාලය - මහනුවර

2023 .11 .01

# පටුන


| පරිච්ඡේදය | පිටු අංකය |
|---|---|
| **01. පරණ පුරුදු** | **01** |
| **02. පොත් ගුල** | **07** |
| **03. නැවත හමුවී....** | **10** |
| **04. මොකද වුණේ?** | **13** |
| **05. සිතියමේ රහස** | **20** |
| **06. සඟවා තිබූ දෙය** | **25** |

# 01

# පරණ පුරුදු

**ඈ**න්ලා ගෙදර හිනාවෙන සද්දයක් ඇහෙනවා. ඒ කියන්නෙ අනිවාරෙන් එයාලා ගෙදර ඇවිල්ලා ඇත්තේ... සිය කාමරයේ ජනෙල් කවුළුවෙන් පිටත බලාසිටි සිසිලි සිතුවේ ඉතා සතුටිනි. "යන්න ඕන තව ටිකකින් ඒ පැත්තේ" එසේ සිතූ ඇය පහළ මාලයට යාමට සූදානම්වත් ම ඇගේ ගවුමේ පැටලුණු කුඩා මේසය නිසා ඇය මේසය ද පෙරලාගෙන බිම ඇද වැටුණාය. සුළු මොහොතකට පෙර ඇය අඳිමින් සිටි සිතුවම හා තීන්ත බෝතල් ද ඒ සමග ම බිම වැටුණේ ඇගේ මුළු සිරුර ම කොළ, කහ, රතු ආදී වෙවර්ණයන්ගෙන් යුත් සිත්තමක් බවට පත් කරවමිනි.

"සිසිලි මොකක් ද ඒ සද්දේ ? ඒ පාර මොකද කර ගත්තේ " පහළ මාලයේ සිටි මවගේ හඬ සිසිලිගේ දෙසවන් සොයා පැමිණියේ ය. මව ඒමට පෙර දඩිබිඩියේ නැගිට ගත් ඇය තීන්ත බෝතල් තම විසල් පොත් රාක්කය යටට තල්ලු කර, මේසය කෙළින් කර සිටවූවා ය. එහෙත් තමා ඇඳ සිටි ගවුමේ තිබූ තීන්ත පැල්ලම් පිළිබඳව ඇයට සිහියක් නොවී ය.

"සිසිලි මොනවද මේ කර කර හිටියේ.." මවගේ ගෝරනාඩුව දොර අසලින් ඇසුණි. "මම නම් ඔය තරම් පාට ගාගෙන, නාගෙන ඉන්න ළමයෙක් ජීවිතේට දැකලා නෑ .....ඉක්මනට බිමත් හෝදන්න වෙයි.. ආය නම් මගෙන් තීන්ත ඉල්ලන්න එපා ..."සිසිලිගේ මව පැවසුවේ අවවාදාත්මක හඬකිනි.

අම්මාට දත් ටිකත් ගණන් කර ගැනීමට හැකි තරමේ සිනහවක් පෑ සිසිලි " ආ.. අම්මේ, ඈන්ලා ඇවිල්ලා වගේ. අම්මාට කියන්න යද්දියි මේසේ පෙරළුණේ " යි පැවසුවා ය.

"ඉතින් ඔහොම පාට පාට පැල්ලම් ඇඟ පුරාම තියාගෙන එහෙට යන්න බෑනෙ, ඉස්සෙල්ලා ගිහින් නාගෙන එන්න'' යි කියමින් මව කාමරයෙන් පිට වූවා ය.

"ඇති යන්තම්" කියා සිතමින් සිසිලි නානකාමරය තුළට රිංගා ගත්තා ය.සුළු මොහොතකින් නැවතත් මව ඉදිරියේ පෙනී සිටි ඇය ඈන් සඳහා ගෙන යෑමට හොඳ මොනවාදැ යි ඇසී ය. "ඔයා කැමති දෙයක්"යි මව පිළිවදන් දුන්නා ය.

නිවසට පැමිණෙන මාර්ගය දෙස බැලූ සිසිලි දුටුවේ මිතුරකු හමු වීමට ගොස් සිටි තම සොහොයුරා ද ආපසු නිවසට පැමිණෙනමින් සිටි ආකාරයයි. "අම්මා මෙන්න අයියා ආවා" සිසිලි කෑගසන්නට වූවා ය. "ආ....... එහෙනම් අයියත් එක්කම යන්න" මුළුතැන්ගෙයි සිට අම්මා සිසිලිට පැවසුවේ නො යිවසිල්ලෙනි.

මීලඟ මොහොතේ සිසිලි හා ඇගේ සොහොයුරා වූ අශේන් සිටියේ ඈන්ගේ නිවස ඉදිරිපිටයි.

"ඈන්... සිසිලි....." බොහෝ දිනකින් හමු වූ මිතුරියන් දෙදෙනාගේ සතුට නිම් හිම් නැති විය. අශේන්ගේ හොඳ ම මිතුරා වූ ඈන්ගේ සොහොයුරා වන සිහින ද නිවසේ සිටියේ ය. කුඩා කළ පටන් සමීප මිතුරන් වූ ඔවුන් සිව් දෙනා කොළඹ පිහිටි නේවාසික පාසල් දෙකක ඉගෙනුම ලැබූහ. අශේන් හා සිහින පහළොස් හැවිරිදි වූ අතර ඈන්, සිසිලි දොළොස් වැනි වියේ පසු වූහ. මෙම නිවාඩුවේ මුල් දින කිහිපය ඥාති නිවසක ගත කර තිබූ ඈන් හා සිහින නිවසට පැමිණ තිබුණේ එදින උදෑසනය.

මින් පෙර නිවාඩු කිහිපයක දී ම ඈන්ලා ගේ නෑ දෑ සොහොයුරෙකු වූ රොශාන් හා ඔහුගේ බාල සහෝදරයාවූ උදිත් ද ඔවුන් සමග නිවාඩුව ගත කිරීමට එක් විය. රොශාන් දහතුන් වියේ සිටිය ද අශේන් හෝ සිහින තරමට ම උස් මහත් විය. ඔවුන්ගෙන් කුඩා ම තැනැත්තා වුණු උදිත් තවමත් අවුරුදු නවයක පුංචි කොලුවෙක් විණ. නමුත් මෙවර නිවාඩුව සඳහා ඔවුන්ට පැමිණීමට හැකියාවක් නොමැති බව දන්වා තිබුණේ ව්‍යාපාරිකයෙකු වූ ඔවුන්ගේ පියාට ඒ සම්බන්ධ කටයුත්තක් සඳහා හදිසියේ ම විදේශ ගත වීමට සිදුවී තිබුණු නිසා ය. ඒ පිළිබඳ මිතුරන් සිටියේ කනගාටුවෙනි.

ඈන්ගේ මව සාදා දුන් තේ කෝප්පය රස බැලූ මිත්‍රයෝ ආගිය තොරතුරු කතා කරමින් ගෙවත්තට ගියහ.

“හරි ළමයි අපිට ආපහු අපේ පරණ පුරුදු පටන් ගන්න වෙලාව හරී”

“හොඳයි එහෙනම්..... දැන් අපි මේ නිවාඩුවට මොනවද කරන්නේ????” පළමුව හඬ අවදි කරමින් අශේන් විමසී ය.

“ආපෝ.... හරි ම කම්මැලියි.. රොශාන් අයියලත් නැනේ... නිදා ගන්නවා කියන එක විතරයි මතක් වෙන්නේ..” ඈන් උදාසීන ලෙස පැවසුවා ය. “මොන දේටත් කම්මැලි කමයි නිදිමතයි.. මේ පාර නම් කරන කිසි දේකට ගාවගන්න හොඳ නෑ ” යි සරදමට කියූ සිහින ඈන්ට ඇද කළේ ය.

“ආයෙමත් නම් එපා!! මේ දෙන්නගෙ රණ්ඩු බේරන්න ගිහින් එදා තව පොඩ්ඩෙන් මගේ ඔළුවත් ඉවරයි” අශේන් විරිත්තුවේ ය.

“හරි හරි දැන් තියන ප්‍රශ්නෙ අපි මේ පාර මොකක් ද කරන්නෙ කියන එක” සිසිලි මැසිවිලි නැඟුවා ය. “ඔව් ඔව් අපි එක එක් කෙනාගෙ අදහස් අහමු... ඔයානෙ පණ්ඩිතයා ඒ නිසා මුලින් ම කියන්න” ඈන් සිහින වෙත ඇඟිල්ල දිගු කළා ය.

"හරි," සිහින ටී ෂර්ටයේ වූ තණකොළ කැබලි පිස දමමින් ලක ලැහැස්ති විය. "ම්ම්ම්..... එහෙනම් අපි පරණ පොත් එකතු කරලා ඒ පොත්වල විස්තර ලියලාඒ පොත් ගැන වැඩි විස්තර හොයමු.. මේක මම ගොඩ කාලෙක ඉදන් හිතන් ඉන්නෙ...." "මොකද කියන්නෙ?" හේ අදහස් දැක්වී ය.

"මොන??" ඈන් නැවතත් වාද කිරීමට දැගලී ය. එහෙත් ඇයට වඩා ඉක්මන් වූ සිසිලි තම අදහස් දැක්වූවා ය. "එහෙනම් අපිට පුළුවන් පොත් එකතු කරලා පුස්තකාලයකුත් දාන්න" අනෙක් අයද හිස සලා එයට එකඟ විය. "හරි, එහෙම හොඳයි, ඒයි සිහියො අපිට ආපහු ඉස්කෝලෙ යද්දී පරණ පොත්, සඟරා එකතුවක් හදන් එන්න කියලා අජන්ත සර් කිව්වා නෙහ්! වැඩ දෙක ගානට සෙට් වෙනවා " ඒ අශේන්ගේ අදහසයි. "හා එහෙනම් එහෙම කරමු" ඈන් කීවා ය.

"ඔයාලා දෙන්නා දැන් යන්නේ නැද්ද? හොදට ම හවස් වෙලා.."

මිතුරන් සිව්දෙනා එක්ව මඳ අඳුර පැතිරී ඇති මඟ ඔස්සේ නිවෙස් වෙත පිය නැඟුහ.

* * * * * *

අශේන් නින්දට ගියේ රාත්‍රී දහයට පමණ ය. ඔහු ආපසු අවදි වන විට උදෑසන අට ද පසු වී තිබුණි. ඒ අවදි වූයේ ද සිසිලිගේ කරදරය නිසාවෙනි.

එදින උදෑසනම අවදි වූ සිසිලි දත් මැද මුහුණ සෝදා තවම නිදා සිටි අයියාව ඇහැරවීමට උඩුමහලට ආවා ය. "ඒයි කම්මැලි රාල.... අම්මා නැගිටින්න කිව්වා." කියමින් අශේන්ගේ හිසින් අල්ලාගත් සිසිලි ඔහුව සොලවන්නට විය. "යනවා යන්න වදේ " යි කෙඳිරි ගෑ අශේන් සිසිලිව තල්ලු කර දමා අනෙක් පසට හැරී නිදන්නට විය. එවර නොයිවසිල්ලට පත් වූ සිසිලි අශේන්ගේ පොරවනය ඇද බිමට දැම්මා ය.

ඇගෙන් ගැලවීමට නොහැකි බව තේරුම් ගත් හෙතෙම ඇඳෙන් නැගී සිටියේ ඔහුගේ වචනයෙන් කිවහොත් සිසිලිට 'හොඳ ම වර්ගයේ හයේ පාරක් ද නිකුත් කරමිනි. "උඟයි!!!!!!!!" යි උඩුමහලෙන් නැඟුණු හඬට හේතුවක් මුළුතැන්ගෙයි උන් මව නොදත්තා ය.

*　*　*　*　*　*

උදෑසන ආහාර මේසයට සිත් සේ යුතුකම් ඉටු කළ ඔවුහු උන්හිටි ගමන් කාන්දම් බවට පත් වූවා සේ ඈන්ලාගේ නිවස බලා වාෂ්ප විය..

ඔවුන් එහි යන විට ඈන් හා සිහින ඉතා උද්යෝගයෙන් මග බලා සිටියහ. "හේයි ගයිස් ගුඩ් මෝර්නිං"අශේන් අනෙක් දෙදෙනාට සුබ පැතී ය. "මෝනිං මෝනිං හොඳ ආරංචියක් තියනවා" සිහින ප්‍රකාශයට පත් කළේ ය. "මොකක් ද මොකක් ද කියනවකො පණ ඇතුව, කවුද මැරුණෙ..චොක්ලට් බිස්කට් කීයක් හොරෙන් කෑවද?" අශේන් කට ඇද කළේ සිහිනට විහිළු කරමිනි. "මේ නිකන් ඉන්නවා" සිහින අමනාපයෙන් ගෙරවීය.

"ආපෝ මො න දෙන්නෙක් ද මන් දන්නෙ නෑ" ඈන් කෙකර ගෑවා ය.

"රොශාන් මල්ලියි, උදිත් මල්ලියි අද එනවලු... මාමයි නැන්දයි විතරයිලු යන්නේ... අද හවස් වෙනකොට මෙහෙට එයි" සිහින පවසන්නට විය. "ඒක හොඳයි නෙහ්..... මේ කෙල්ලො එක්ක ම ඉඳලා මට ඇති වෙලා කිසි කමකට්......... " අශේන් පවසන්නට හැදූ දෙය පවසා නිම කිරීමට පෙර ඈන් හා සිසිලි එකවර බෙරිහන් දෙන්නට වූහ.

"හරි හරී මේ හොඳට ම ඇති.. දැන් අපි මේ අපේ වැඩේට පොත් එකතු කරන්නේ කොහොමද" අවසානයේ දී සිසිලි ප්‍රශ්න කළා ය.

“හොඳයි දැනට අපේ ළඟ තියන පොත් මොනවද බලමු.. කෝ කියන්න ” සිහින මූලික විය.

“හැරී පොටර් ,පර්සි ජැක්සන් ,ඈන් , ,ෂර්ලො ............... “ඒහ්!! අපි කියන්නෙ ඔය වගේ පොත් නෙවෙයි. පරණ සාහිත්‍ය පොත් , පත්තර වගේ ඒවා. ” අශේන් සිසිලිගේ පොත් ලැයිස්තුව අතර මඟ නවතා දමමින් කීය.

“ඔහ්! එහෙම ද එහෙනම් අපිට මදූ අක්කගෙනුත් උදව්වක් ගන්න පුළුවන් වෙයි ද?” ඈන් විමසුවා ය. “ආ... මතක් කරල දුන්න එක නම් හො දයි. අපි එහෙනම් එහෙම කරමු...”අශේන් හිස සැලුවේ ය.

“අපි එහෙනම් දැන් යමු ද? එයා හෙට එයාගෙ නංගිලා ගෙ ගෙදර යනවලු, එහෙම වුණොත් මම හිතන්නෙ අපිට එයා-ව හම්බවෙන්න බැරි වෙයි.......”සිසිලි වටින් පිටින් කනට දාගත් ආරංචිය සෙස්සන්ට දැනුම් දුන්නේ මදක් ආඩම්බරයෙනි.

පිරිස මෙයින් කලබලයට පත් වූහ. “ම්... අපිට එහෙනම් රොශාන්ල එනකන් ඉන්න විදිහක් නැහැ... දැන්ම ම යන්න වෙනවා....” සිහින පැවසුවේ ය.

*   *   *   *   *   *

තම තමාට උවමනා දේ රැගෙන ආ මිතුරෝ කථිකා කර ගත් පරිදි වහ වහා මදූ අක්කා මුණගැසීමට පිටත් වූහ.

# 02

# පොත් ගුල

**මෙ**ම මොහොතේ පාර දෙස බැලූ ඕනෑම කෙනෙකුට තම තමාගේ බයිසිකල්වල නැඟී පහළ මාවතේ පිහිටි මදූගේ නිවස දෙසට ගමන් කරන ළමයින් සිව්දෙනා දැක ගත හැකි ය. මදූ අක්කා සඳහා ගෙන විවිධ දෑ සයිකල්වල ඉදිරිපස කොටසේ දමා ගෙන තිබිණි.

මදූ වයස අවුරුදු තිස්හතක් තිස්අටක් පමණ වූ කාරුණික තැනැත්තියකි. ඇය අනෙක් අයට වඩා මදක් අමුතු චරිතයක් විය. කුඩා කළ පටන් එකතු කරගත් පොත් රාශියක් ඇය සතුව තිබුණි. මෙනිසා ඇගේ දැනුම ද ඉතා හොඳ මට්ටමක පැවතුණි. කුඩා නිවසක තනිව ජීවත් වූ ඇය නිහඬ තැනැත්තියක් වුව ද අපේ කුඩා මිතුරන් ඇය හා ඉතා කුළුපග වූවා ය.

ඇගේ නිවස කුඩා වුව ද අලංකාර ස්ථානයක් විය. ගේට්ටුව අසල සයිකල් නතර කළ පිරිස ගෙවත්තට ඇතුලු වූහ. එම මොහොතේ මදූ අක්කා සිටියේ ගෙවත්තේ මල් පාත්තිවලට සාත්තු කරමිනි. තම අමුත්තන් පිරිස දුටු මදූ අක්කා ඔවුන් වෙත සුන්දර සිනාවක් පෑවා ය.

"ආ..මොකද කට්ටිය මේ පැත්තේ?" ඇය සිනාවෙමින් ම විමසුවා ය. "ආහ්, මේ.... අපිට අක්කගෙන් පොඩි උදව්වක් ඕන "සියල්ලන්ට පෙර මැදට පැන ගත් ඈන් සවිස්තරාත්මකව කරුණු දැක්වූවා ය.

"ඔහ්. එන්නකො ඇතුළට.. ඔයාල කැමති විධියෙ ඕනෑම පොතක් කියවලා ඒ ගැන හොයලා බලන්න. හැබැයි ඔයාලට කරන දෙයක් අද ම කර ගන්න වෙනවා... මොකද, මම හෙට අපේ නංගිලාගෙ ගෙදර යනවා" ඇන්ගේ විස්තරයට සවන් දුන් මදූ අක්කා පැවසුවා ය. ඉතා උද්යෝගයෙන් සිටි පිරිස ද හිස සලා එයට එකඟ විය.

ඇන්ගේ සහ සිසිලිගේ අත්වලින් අල්ලා ගත් මදූ අක්කා ඔවුන් කැටුව ඉහළ මාලයට ගියා ය. එහි මුල්ලක වූ දොරක් ඇරගත් ඕ එතුළට පිවිසියා ය. එය මදක් අඳුරු වුව ද අලංකාර විය. බලන සෑම තැන ම පොත් රාක්ක තබා තිබුණි. මල් බඳුන් හා සිතුවම් ආදිය එහි අලංකාරය වැඩි කළා සේම කවාකාර ජනෙල් සහ වාකවුළු එහි ගුප්ත බවක් ඇති කළේ ය.

"මේ මගේ පොත් ගුල! ඔයාලා මොකද හිතන්නේ" මදූ අක්කා සතුට සහ උද්යෝගය මුසු හඬකින් විමසුවා ය. "එහ්! මේක නම් ඇත්තටම... නියමයි" පුදුමය නිසා යන්තමින් මුව විවර කර ගත් අශේන් පැසුවේ ඇස් දෙකත් උඩ දමා ගෙන ය... ඔහුට හා සිසිලිට කුඩා කළ සිට ම මෙවැන්නක් තම නිවසේ ද සාදා ගැනීමට උවමනා විය. එහෙත් එය පහසු දෙයක් නොවූයේ එතරම් පොත් ගොඩක් සොයා ගැනීමට අපහසු නිසාවෙනි.

කෙසේ වුව ද මදූ අක්කා නම් ඔවුන්ගේ පුදුමයෙන් විනෝදයක් ලබන බව පෙනුණි. "හරි ළමයි ඔයාලා කැමති විදිහකට පොත් බලලාවැඩි පොත්වලින් ටිකක් ඇරන් යන්නකෝ ........ "පොත් ගුල පසෙක වූ මේසය මත තිබූ පොත් ගොඩ පෙන්වමින් ඇය හිනැහුනා ය.

*      *      *      *      *      *

ඔසවා ගෙන යා මටත් අපහසු අන්දමේ පො ත් මිටි කිහිපයක් රැගත් අපේ මිතුරන් පොත් ගුලට සමුදීමට සූදානම් විය.

"ඕඕ... ඔයා ලා යන්නද හදන්නේ?? ඉන්නකෝ මම ආපහු එනකොට ඔයාලට අලුත් විධියේ පොත් ටිකක් හොයන් එන්න" මදූ අක්කා කීවා ය... "අයියෝ !! මට හෙට වෙද්දි කරලා ඉවර කරන්න මොනතරම් වැඩ ගොඩක් තියනව ද " එක්වර ම මදූ අක්කා මැසිවිලි නඟන්නට වූවා ය. එය ඇගේ සාමාන්‍ය ස්වභාවයයි.

"ආන්! එහෙනම් අපි එන්නම් හෙට උදෙන් ම ඔයාට උදව් කරන්න... එර්ර්ම්.. මම කිව්වේ ඔයා කැමති නම්?" නිතරම මෙවැනි දේවල් ම සිදු කරන ඈන් ඉතා උනන්දුවෙන් විමසුවා ය. "ඇත්තට ම ඔයාලා හරි ම හොඳයි. ඒ උනත් ඔයාලා කරදර වෙන්න ඕනෑ නෑ .. ඒ උනා ට ඔයා ලා ආවො ත් මම තරහ වෙන්නෙත් නැහැ" මදූ අක්කා කීවා ය.

මීලඟ දිනයේ ආපසු ඒමට පො රො න්දු වූ ළමුන් සිව්දෙනා නැවතත් නිවසට ඒමට පිටත් වූයේ එදින ම තවත් පැය කිහිපයකින් පැමිණෙන රොශාන්ව සහ උදිත්ව පිළිගැ-නීමටයි.

# 03

# නැවත හමුවී....

**හ**නි හනික නිවෙස් වෙත ඉගිලුනු ළමුන් කුණු තැවරී ඇති ඇඳුම් මාරු කර ඈන්ගේ නිවස ඉදිරිපිටට පැමිණියේ රොශාන් හා උදිත් පිළිගැනීමටයි.

"ආආහ්! එයා ලා කො හො මද දැන් මෙහෙ එන්නේ? තනියම වෙන්න බෑ " සිසිලි ඈන්ගෙන් ප්‍රශ්න කළා ය. "අපොයි නෑ ... බය වෙන්න ඕන නෑ ..... ඔය පොඩි අත දරුවො දෙන්න කොහොමද තනියෙන් එන්නෙ? තාත්තා වැඩ ඇරිලා එයාලත් එක්කරගෙනයි එන්නේ......." ඈන් මුහුණ විකාර කර පෙන්නුවා ය.

යෙහෙළියන් දෙදෙනා කැකිරි පලන්නට වූයේ ඈන් රොශාන්ව කුඩා දරුවකු ලෙස හඳුන්වනු ලැබූ නිසා ය. ඔහු ඔවුන්ට වඩා වැඩිමලහලු වූයේ වසරකින් වුව ද ඔහු නිතරම හැසිරුණේ ලොක්කෙකු මෙනි. හෙතෙම සෑම විටම උත්සහ කළේ තමා තරම් කෙනෙක් නොමැති බව පෙන්වීමටය. මේ නිසාවෙන් ඈන් හා සිසිලි ඔහුව හැඳින්වූයේ සියල්ලදත් යන නමිනි.

"හාහ්! මේ මොකද? බලාගෙන හුස්ම හිරවෙයි.. " එම මොහොතේ එතැනට පැමිණි අශේන් හා සිහින විහිළුවට මෙන් පවසන්නට වූහ.

මද වෙලාවක් තණ බිස්ස මත හිඳගෙන කතා කරමින් සිටි මිතුරන්ට නිවස දෙසට පැමිණෙන මෝටර් රථයක හඬ

ඇසුණි. “අම්මෝ.... මෙයාලා ආවෝ...... “ ඈන් කෑගසන්නට වූවා ය.

කුඩා අමුත්තන් දෙදෙනා සාදරයෙන් පිළිගත් ඔවුන් ගෙවත්ත අයිනේ වූ ගල් බංකු මත හිඳ කතාබහේ යෙදුණෝ ය.

“මොකද ඉතින් නිවාඩු කාලෙ කරන්න යන්නේ?" උදිත් විමසීය. ඔවුන්ගේ පොත් එකතු කිරීමේ වැඩය ගැන අශේන් උඩින් පල්ලෙන් කියා දැමුව ද මදූ අක්කාගේ පොත් ගුල පිළිබඳ දිගු විස්තරයක් කීමට හෙතෙම අමතක නොකළේ ය. තමන් නැතිව සිසිලි , ඈන් , අශේන් සහ සිහින මදූ අක්කාගේ පොත් ගුල නැරඹීමට ගිය බව ඇසූ රොශාන්ගේ මූහුණ බෙරි විය.

“ආහ්, ගණන් ගන්න එපා මම හිතන්නෙ අපිට හෙට උදේටත් පොත් බලාගන්න පුළුවන් වෙයි” සිහින කීවේ එතැන ලෝක විනාශය ආරම්භ වීමට පෙරාතුවයි.

“බලන්නකෝ ! මේ වාරෙ ඉස්කෝලෙදි මම හැදුව කවි... හොඳයි ද?” ඒ අතර වාරයේ උදිත් විමසා සිටියේ ආශාවෙනි. “කෝ බලන්න බලන්න “ ඔහුගේ කවිවලට කැමැත්තක් දක්වන සිසිලි විමසා සිටියා ය.

“ගිය මාසෙ අපෙ ඉස්කෝලෙ හතරෙ පන්තියේ ළමයි හැ මෝවම එක්කන් ගියා ඉස්කෝලෙට පහළින් තියන ගඟ බලන්න.. ඒක දැක්කම තමයි මට මේ කවිය මතක් වුණේ” ඔහු වැඩි දුරටත් පැවසුවේ ආඩම්බරයෙනි.

සැබවින් ම එම කවි ඉතා ඉහළ මට්ටමක පැවතුනා සේම ඉතා අලංකාර විය. “ආහ් ඒක හරි ම ලස්සනයි” තම සාක්කුවේ තිබූ ටොෆී දෙකක් උදිත්ට දෙමින් සිසිලි කීවා ය. “ඒයි මටත් ඕන”එයින් එකක් උදුරා ගනිමින් රොශාන් විරිත්තුවේ ය.“ඒයි.. ඒක මගේ.....” උදිත් කන් බිහිරි කරවමින් කෑගසන්නට විය. “හෙට මං තමුන්ට කවියක් ලියලාදෙන්නම්” රොශාන් කීවේ විහිළුවට ය. “ආ ඉන්නකෝ“ යැයි පැවසූ ඈන් විශාල චොක්ලට්

පෙත්තක් උදිත්ට දුන්නේ රොශාන්ගේ ඇස් ඇහිබැම නෙක් එසවෙද්දී ය.

"මේ මේ උදිත් මල්ලී එයාගෙ කවි නෙවෙයි, එයා ගැන හැදුව ඔයාගෙ කවියක් හෙට අපිට කියන්න" ඈන් ඇසක් ගසමින් උදිත්ට කීවා ය. එයින් රොශාන්ගේ තරහ ඇවස්සිණි.

එම මොහොතේ ඈන්ගේ මව කතා නොකළා නම් අනිවා -ර්යයෙන් ම රණ්ඩුවක් ඇති වීමට ඉඩකඩ තිබුණි. "පුතාලා ඇයි එළියෙ ඉන්නෙ සීතල නැද්ද එන්න ගෙට"

"අහ්, රෑ වෙලා නේද, අපි දැන් යමු නේද නංගී" අශේන් සිසිලිට පැවසුවේ ඒවන විට ද මද අඳුරක් එම පරිසරය පුරා පැතිරී තිබූ නිසාවෙනි. "හෙට උදේම යමු එහෙනම්" මිතුරන්ට සුබ රාත්‍රියක් පතමින් සිසිලි ද කීවා ය.

# 04

# මොකද වුණේ ?

**ප**සුදා උදයේ ම අවදි වූ උදිත් තම සොහොයුරා වූ රොශාන් පමණක් නොව අනෙක් අය පිළිබඳව ද කවි පබැඳුවේ තනිව සිනාසෙමිනි. ඔහු සිතා සිටියේ එම උදෑසන සියල්ලන් ඉදිරියේ එය පැවසීමටයි. නමුත් ඒ සඳහා අවස්ථාව උදා වන්නේ බොහෝ දිනකට පසුව බව පුංචි කවියා දැන සිටියේ නැත.

*　　*　　*　　*　　*　　*

"අශේන්... ඒයි අශේන්..." සිහින අශේන්ලා ගේ නිවස අසලට පැමිණ කතා කළේ ය. "ආ.....ආවද" කියමින් සිසිලි හා අශේන් බයිසිකල් දෙක ද රැගෙන කඩිමුඩියේ පාරට පැමිණියේ ඉතා උද්යෝගයෙනි.

උදෑසන සුන්දරත්වය විඳිමින් , සතුටින් යුතුව ළමුන් සය දෙනා මාර්ගයේ පසෙකින් ගමන් කළහ.

එනමුත් මදූ අක්කලාගේ නිවසට ළඟාවත් ම කුමක් හෝ වරදක් සිදුවී ඇති බව ඔවුනට වැටහුණි. ඇගේ නිවස ඉදිරිපිට

පොලිස් ජීප් රථයක් නවතා තිබුණු අතර ඒ අවට මදක් කලබලකාරී බවක් දක්නට ලැබුණි.

ඔවුන් නිවසේ ගේට්ටුවෙන් ඇතුළුවත්ම ඔවුන්ගේ අසල්වැසියකු වූ කනිශ්ක එහි සිට පැමිණියේ ය. ඔහු ඉතා ප්‍රවේශමින් ඇසුරු කළ යුතු කපටි ළමයෙක් විය. ඔහු හා ඔහුගේ මිතුරන් ගමේ නොයෙක් තැන්වල ඇවිදිමින් බොහෝ දෙනාට කරදරකාරී වන දෑ කළේ ය. ඔහුගේ වයස අවුරුදු දහහතරක් පමණ වුව ද ඔහුට තිබුණේ අවුරුදු විස්සක වැනි මැර පෙනුමකි.

"ආ...ඉතින් තමුන්ලා අරයගෙ යාළුවොනේද? අනේ පව්! එයාගෙ අර මීගුලට හොරු පැනලලු, කාටද දන්නෙ නෑ ඒ පුස් කාපු පොත්වලින් වැඩක් තියෙන්නෙ" ඔවුන් වෙත පැමිණි කනිශ්ක සමච්චලයට කීවේ මදූ අක්කාව පෙන්වමිනි.

"මොකක්? මම අද........" කියමින් රොශාන් ඇරඹුවද කනිශ්කගේ හැටි දත් අශේන් හා සිහින අනෙක් සිව් දෙනා සමගින් එතැනින් ඉවත් විය.

"මොකක් ද! ඒ හොරු පැන්න කතාව මොකක්ද?"උදිත් විමසුවේ පුදුමයෙනි."ම්ම්හ්... අනේ මන්දා ඒ උනාට මොනව හරි වෙලා තියනවා වගේ මට නම් හිතෙන්නෙ..............." සිහින පවසත්ම ඔවුන් අසලට පැමිණියේ මදූ අක්කායි. ඇන්, සිසිලි , අශේන්, සිහින හා අනෙක් දෙදෙනා දැකීමෙන් ඇය සතුටු වූ බව පෙනුණි.

"අයියෝ .. බලන්නකෝ කවුරු හරි මගේ පොත් ගුලේ පොත් හොරකම් කරන්න හදලා . මම අද උදේ දැක්කේ.. දැන් නම් මට නංගිලා ගෙදර යන්න හිතෙන්නෙත් නැහැ, මම එයාට කිවුවා එන්නෙ නෑ කියලා." මදූ අක්කා පැවසුවේ ඉතා කනගා-ටුවෙනි. ඇය බොහෝ සේ කනගාටුවට පත්ව සිටින බව ළමුන්ට වැටහුණි.

කිසිවෙක් තවත් යමක් කීමට පෙර එහි පැමිණ සිටි පොලිස් නිලධාරියෙක් ඔවුන් අසලට පැමිණියේ ය. "මිස්, අපි දැන් යනවා. උවමනාවක් වුණොත් කතා කරන්න." යි පවසා අනෙක් නිලධාරීන් සමග නිවසින් පිටව ගියහ.

ඉන් පසු ළමුන් නිවස තුලට කැඳවාගෙන ගිය මදූ අක්කා දීර්ඝ විස්තරයක් පැවසුවා ය.

පොත් ගුලට සිදු වී ඇති විනාශය දුටු ළමුන් ද කම්පනයට පත් විය. කිසිවෙකු විසින් එහි පොත් පත් හා පොත් රාක්ක උඩු යටිකුරු කර තිබුණි.

"අනේ!"ඒ දුටු සිසිලිට කියැ විණි. "ම්ම්..මේ.... එයා ලා මොනවද ඇරන් ගිහින් තියෙන්නේ?" එවර කතා කළේ ඈන් ය. "අහ්, මට ඒ ගැන නම් හොයන්න බැරි වුණා". මදූ අක්කා එක් වරම කලබල වූවා ය.

"හො, හෝ..... එහෙ නම් අපි මෙහෙ ටිකක් අස් කරලා මෙතන පොත් අඩු ද බලමු....."

* * * * * *

"මොකක් හරි පොතක් අඩු වෙලා ද?" පුංචි උදිත් දෑස් ලොකු කර විමසුවේ කුතුහලයෙනි. "ම්ම්.... පොත් නම් අඩු නෑ.. ඒ උනාට මම දැක්කා ඊයේ මේ මේසෙ උඩ පරණ කොළයක් නවලා තියලා තියනවා ඒක දැන් නැහැනේ... " අශේන් කල්පනා කරමින් පැවසුවේ ය.

" කොළේ? මොන කොළේ ද? එයාලට ඒකෙන් ඇති වැ ඩේ මොකක් ද " මදූ අක්කා පුදුමයටත් කලබලයටත් පත් වූවා ය. "මොකක් ද ඉතින් ඒකෙ තියන වැදගත්කම" රොශාන් ඉතා උවමනාවෙන් විමසුවේ ය.

"ඇත්තට ම ඒක තේරුමක් නැති කතාවක්... එන්න දැන් දවල් වෙලා.. අපි මොනවා හරි කාලා ඉමු. ඒ ගමන් මම ඔයාලට ඒ කතාව කියන්නම්."

එසේ පවසමින් ළමුන් කෑම කාමරයට කැඳවාගෙන ගිය ඇය විවිධාකාරයේ රසවත් ආහාර පාන පිළිගැන්වූවා ය. "අනේ අක්කේ දැන් අර කතාව කියන්නකෝ......" සිත් සේ කාබී අවසන් වූ පසු පිරිස මදූ අක්කාට ආයාචනය කළහ.

"අහ්, හරි, ඒත් මේක නිකන් සුරංගනා කතාවක් වගේ. මම දන්න විදිහට නම් මේක ඉස්සර ඉඳල අපේ පවුලෙ තියන දෙයක්. මුලින් මට මේක කිවුවේ අපේ අම්මා.. ගොඩ කාලෙකට කලින් අපේ අත්තම්මලු මේ ගෙදර හිටියේ. දැ න් මෙහෙම උනත් මේ ගෙදර ගො ඩක් පරණයි. ඉතින් අපේ අත්තම්මා තරුණ කාලෙ ඉඳල ම එක එක රටවල්වල දූපත්වල සංචාරය කරන්න කැමතියිලු. ඒ උනාට ටික කාලෙකට පස්සෙ අත්තම්මා ලෙඩ වෙලා ඇඳට වැටුණලු. එයා ඒ ටිකේම මොනවදෝ හංගලා තියන දෙයක් ගැන ම කියවන්න පටන් ගත්තලු. එයාට හරි සිහියක් තිබ්ලත් නැහැ . ඒ නිසා අම්මලා ඒ කියන දේ ගැන ඒ තරම් හිතලා නෑ. කො හො ම උනත් අන්තිම මො හො තේ අත්තම්මා අම්මගේ අතට මො කක්දෝ පෙට්ටියක් දීලා තියනවා. එයා මොනවදෝ කියන්න හැදුවත් එයාට කියන්න පුළුවන් වෙලා තියෙන්නේ 'ඒක ගන්න' කියලා විතරයි. ඒ පෙට්ටියේ තිබ්ලා තියෙන්නෙ සිතියමක්. අම්මා ගිය මාසේ රට යන්න කලින් ඒ සිතියමයි ඒකෙ තව අම්මා ඇන්ද කටු සටහනකුයි මට දීලා ගියා. ඒ කටු සටහන තමයි ඊයේ රෑ හො රකම් කරලා තිබුණේ. මමයි නංගියි එයාලගෙ ගෙදර යන්න හිටියේ මේ ගැන කතා කරන්න. " යි කියමින් මදූ අක්කා කතා ව අවසන් කළා ය.

ඒත් සමග ම මිතුරු කැලගේ ප්‍රශ්න පිටාර ගලන්නට විය.

"ආආ... හ්! ඔයාගෙ අම්මා රට ද?? ඔයා අපට එහෙම දෙයක් කියලා නෑනේ " ඈන් පුදුම වූවා ය.

"ආහ්, ඔව්... එයා සාමාන්‍යයෙන් නිදහසේ ඉන්න කැ මති කෙනෙක්." මදූ අක්කා උරහිස් හැකිළුවා ය.

"ඒ කියන්නෙ අනිත් සිතියම තවම අක්ක ළඟ තියනවා ද?" සිහින උනන්දුවෙන් විමසීය. "ඔව් ඒක නම් තියනවා ඒත්... ඒකෙ වැදගත්කමක් ගැන මට හිතා ගන්නවත් බෑ ."අසල වූ කබඩයක ලාච්චුව අරිමින් ඕ පැවසුවා ය.

එම සිතියම එකම අවුල් ජා ලයක් විය. එහි රූප සටහහන් මගින් සියල්ලක් ම දක්වා තිබිණි.

එය සැබවින් ම ළමුන්ට ගැටලුකාරී විය. "අහ්, මේක ඇත්තටම අමුතුයි. ඒත් මට හිතාගන්න බැරි සිතියම ගත්ත කෙනා ඒ ගැන දැන ගත්තෙ කොහොමද කියලා.

"මම මේකෙ සටහනක් ඇඳ ගත්තට කමක් නැද්ද?" රො ශාන් විමසාසිටියේ ඉතා උනන්දුවෙනි. "ඔයාල කැමති නම් මේ සිතියම ම ගන්න, උදව්ව විදිහට මට මේකෙ තියන පටලැ විල්ල ලිහලා දෙන්න පුළුවන් ද? " ඇය බලා පො රො ත්තු සහගතව පැවසුවා ය.

පුදුමයට පත් මිතුරෝ මුහුණට මුහුණ බලාගත්හ. "අපි කැමතියි" හඬවල් සයක් එකවර නැඟිණි.

"අක්කලා ඇරුනම මේ ගැන දන්න වෙන අය ඉන්නව ද " එවර අශේන් කල්පනාකාරීව ඇසුවේ ය.

"අම්.... මට හරියටම ඒ ගැන කියන්න බැහැ ,ඒත් එක නැන්දා කෙනෙක් ඉන්නවා අපිට දුර නෑකමක් තියන. මට මතකයි මම පොඩිකාලෙ මොකක් හරි දෙයක් ගැන ප්‍රශ්නයක් ඇති වුණා. මම හිතන විදිහට නම් මේ හංගලා තියනවා කියන දේ ගැන එයාල කතාවුණේ. පස්සෙ කාලෙකදි අම්මා මට කිව්ව

විදිහට ඒ නැන්දට ඕන වෙලා තියෙන්නෙ මේ සිතියම ඇරන් තනියම හංගලා තියන දේ ගන්න. අම්මලා ට ඒකට තරහ ගිහින් තියනනවා, මොකද එයාට අපේ එක්ක ළඟ නෑකමකුත් නැති නිසා. කොහොම හරි එදා අවුරුදු ගානකට කලින් එයා ව දැක්කට පස්සෙ කවදාවත් මට නැන්දව හම්බ වෙලා නෑ." මදූ අක්කා කල්පනාකාරීව කියා සිටියා ය.

"එහෙනම් අනිවාරෙන් ම මේ හොරකමට එයාගෙත් මොකක් හරි සම්බන්ධයක් ඇති???" සිසිලි විමසා සිටියා ය.

"මම හිතන්නෙ නෑ..... එයා ඉන්නෙ කැනඩාවෙලු, දැන් අවුරුදු දහයක් වෙනවලු ගිහිල්ල."

"ඒත් අපි මුලින් ම කරන්න ඕන මේ ගැන හොයන එක." සිහින පැවසුවේ පසෙකින් ඇති සිතියම දක්වමිනි. "ඒත් ඒ කට්ටිය ගා වත් දැ න් මේකෙ පිටපතක් තියනවනේ.." "අහ් ඒකෙ ප්‍රශ්නයක් නෑ ... මො කද, ඒ සිතියමේ සමහර තැන්වල වැරදි තියනවා . අනිත් එක ඒකෙ සම්පූර්ණ සිතියම නැහැ." මදූ අක්කා දැනුම් දුන්නා ය.

"ඒක හොඳයි, ආ.. දැන් වෙලාව දවල් දෙකයි.. අපි හෙට එද්දි කො හො මම හරි මේ ගැ න හො යන් එනවා." එලෙස පොරොන්දු වූ මිතුරෝ තම නිවෙස් කරා පැමිණියහ.

* * * * * *

"අයියෝ...... අම්මා කිවුවා නේද අද ලොකු මාමලා දිහා යනවා කියලා. ඒ කියන්නෙ එනකොට හවස හයවත් වෙයි.." එක් වර ම සිසිලි කන් කෙඳිරි ගාන්නට වූවා ය.

"අපෝ...... ඔව්මයි..... දැන් කරන්න දෙයක් නෑ අපි කලින් එන්න බලන්නම්, ඔයා ලා එහෙනම් මේ වැ ඩේ කරන්න." අශේන් ද සමුගනිමින් පැවසුවේ ය.

කෙසේ හෝ මෙම සිතිසමේ සඳහන් දෙය සොයා ගන්නා අදහසින් යුක්තව මිතුරු කැල නිවෙස් කරා ඇදුණේ තමාගේ වැඩ කටයුතු සිදු කර ගැනීම සඳහා ය.

# 05

# සිතියමේ රහස

**කො**තරම් කල්පනා කළ ද නිවසේ රැඳී සිටීමට ක්‍රමයක් අශේන්ට සිතා ගැනීමට නොහැකි විය. මෙසේ සිතමින් සිටි ඔහු තම කාමරයට පැමිණි මව දුටුවේ නැත.

"පුතා,"ඕ අශේන් ඇමතුවා ය."අද ඔයාට සිංහල පන්ති තියනවා නේද? අන්න ක්ලාස් එකේ ලින්ක් එකත් එවලා.... නංගිගෙත් ඔළුව රිදෙනවලු ඒ නිසා එයත් ගෙදර ඉන්නම්ලු. තාත්තයි මමයි ගිහින් එනකම් නංගිවත් බලාගෙන ඉන්න. කැමති නම් සිහිනලාගෙ ගෙදර යන්න" යි කියමින් මව පිටව ගියා ය.

මෙයින් කිසිවක් සිතාගත නොහැකි වූ අශේන් අන්දුන් කුන්දුන් විය. "මොන? සිංහල පන්ති! මැඩම්ලට වෙන වැඩ නැතුවද." නමුත් දුරකතනය ගෙන පරීක්ෂා කළ බැලූ ඔහුට කාරණය වැටහුණි. එහි ගෲප් එකෙහි සාමාජිකයන් ලෙස තිබුණේ ඔහුගේත් , ඔහුගේ මවගේ දුරකතන අංකයත් පමණි.

* * * * * *

සැබවින් ම එය සිසිලිගේ වැඩකි. නිවසට පැමිණි විගස ඇය සිදු කළේ මවගේ හා සොහොයුරාගේ දුරකතන අංක යොදාගෙන ගෲප් එකක් සාදාගෙන අශේන්ගේ ගුරුතුමියගේ නමින් එයට ලින්ක් එකක් දැමීමයි. එය කොතෙක් දුරට

සාර්ථක වේදැයි නොදත්තද අවස්ථාවට අනුව කළ හැකි හොඳ ම දෙය එය බව ඇය සිතුවාය.

*          *          *          *          *          *

"අහ්, වැඩේ හරි නේද? " අම්මාත් තාත්තාත් පිටව ගිය පසු එළියට පැමිණි සිසිලි කීවේ උඩ පනිමිනි. "ඒක නම් හරි, අම්මෝ ඒ වුණාට බයේ බෑ මෙයා එක්ක ඉන්නත්.." අශේන් පැවසුවේ සැබෑවට ම තම කුඩා සොහොයුරිය පිළිබඳව පුදුමයෙනි.

"ඒකෙන් කාටවත් කරදරයක් වෙන්නෙ නැහැනෙ. ඒ නිසා කමක් නෑ." සිසිලි දඟකාර ලෙස පැවසුවා ය.

"දැන් තමා ලොකුම වැඩ ටික තියෙන්නෙ.. මෙන්න මෙහෙ එනවා යන්න." ඔවුන් දෙදෙනා ඇන්ගේ නිවසට රො කට්ටුවක වේගයෙන් දිව ගියහ.

*          *          *          *          *          *

ඔවුන් එහි යන විටත් අනෙක් අය වැඩ අරඹා තිබුණි. "අහා.... කොහොමද පැන ගත්තේ??" පළමුව ඔවුන්ව දුටු රොශාන් ඇසුවේ ය. සිසිලි එය කෙටියෙන් විස්තර කළේ සෙස්සෝ සිනාවෙන් පුපුරා යද්දීය.

"ඒක නෙවෙයි දැන් මේක ගැන මොකද" සිතියම පෙන්වමින් අශේන් විමසීය.

"ආ... ඔව්, මේක නම් ටිකක් විතර තේරුම් ගන්න අමාරුයි." සිහින මානකාවට මුල පිරුවේ ය.

"ටිකක්?? හොඳ ටිකක්!.."

ඉන් පසු සියල්ලෝම සිතියම අතට ගෙන පිරික්සා බැලූහ. කිසිවෙකුට එය නිසි පරිදි වටහාගත නොහැකි වූයෙන්

ඔවුහු එය උඩු යටිකුරු කර හරවා බැලූහ. පසුපිට හරවා බැලූහ. එනමුත් කිසිවෙකු එය හඳුනාගන්නට සමත් නොවීය.

"අපෝ...... නිල් ලිට්මස් රතු ලිට්මස් වෙන් කරන එකවත් මේතරම් අමාරු නෑ..." සිසිලි කෙඳිරි ගෑවා ය.

"ඔහ්, ඔයා හරි. ඔයා හරි.."අලුත් අදහසක් පහළ වූවා සේ හඬ නැඟූ රොශාන් එක් වර ම නිවස තුළට දිව ගියේ ය. "සියල්ලදත්ට මොකද දන්නෑ ඒ පාර. " ඈන් හා සිසිලි මුහුණට මූන බලා ගත්හ.

මීළඟ මොහොතේ රොශාන් එහි පැමිණියේ වතුර භාජනයක් ද රැගෙනයි. "අපි මේක වතුරෙ ඔබලා බැලුවොත් මොකද?" හෙතෙම ආඩම්බරයෙන් විමසුවේ ය. "අන්න වැඩේ මල්ලියා..... " අශේන් හා සිහින ද ඔහුට අනුග්‍රහ දැක්වූහ.

රොශාන් හොඳ නම ලබාගැනීම පිළිබඳ අමනාපයෙන් යුතුව වතුර භාජනයට දැමූ සිතියමට එබුණු සිසිලි, දුටු දෙයින් විස්මයට පත්ව හඬ නැඟුවා ය. එහි වූ රේඛා සහ ඉරි කැබලි මතින් තවත් රේඛා මතුවී තිබුණේ පැහැදිලි රූප සටහනක් මවමිනි.

"ඒක හරි ගියා.."යැයි උදිත් හඬ නගන විට තම සාක්කුවෙන් ගත් කුඩා සටහන් පොතක අලුත් සිතියම ඇඳ ගැනීමට ඈන් උත්සුක විය.

"නියමයි! දැ න් පළවෙනි ප්‍රශ්නය ඉවරයි... දෙවනි ප්‍රශ්නය තම,යී.... "අනේ මේ අපි ඊට කලින් මොනව හරි කාලා ඉමුකෝ." අශේන් පවසන්නට ගිය දෙය යටපත් කරමින් උදිත් කීය.

"අපි කන ගමන් වැඩ කරමු" මුළුතැන්ගෙයට දිවූ ඈන් රසකැවිලි තොගයක් ඔසවාගෙන ආවා ය.

"ම්ම්ම්..... හරි දැන් සිතියම තිබුණට මේ සිතියමෙන් කියන්නෙ මොන වගේ තැනක් ගැනද?" සිසිලි ටොෆියක් කටට දමා ගන්නා අතරේ විමසුවා ය..

"අපි දැන් දන්න විස්තරත් එක්ක බලද්දි... ඒ ගොඩක් දුරට මදූ අක්කගෙ ගෙදර වෙන්න ඉඩ තියනවා.නැද්ද?" සිහින කීය.

"ඒක එහෙම නම් මේ රූප මොනවද?" එම පැනය රෝශාන්ගෙනි.

"හරි, අපි මෙහෙම බලමු. මේ සිතියම වටේට තද රතු පාටින් ඇන්ද කොටුවක් තියනවා... මට මතක විදිහට මදූ අක්කලාගෙ ගෙදරත් ගොඩක් තැන්වල බිත්තිවල මේ පාටින් රේඛා මෝස්තර වගේ දේ ඇඳලා තියනවා.. මේ සිතියමේ තියෙන්නෙ මදූ අක්කලාගෙ ගෙදර ගැන කියලා අපි හිතුව දේ හරි කියලා මේකෙන් පේනවා.. " අශේන් විස්තර කළේ ය.

"ඒ වගේ ම තමයි අනිත් දේවල් ඔක්කො ම ඇඳලා තියෙන්නෙ ඒ රතු කොටුව මැද, ඒ කියන්නෙ මේක ගෙදර ඇතුළෙ සිතියමක් වෙන්න ඕන." සිහින ද මැදින් පැන වචනයක් දෙකක් ඒ අතරට එක් කළේ ය.

"ආආ.... ඇයි එතකොට මේ සිතියම ඇඳලා තියන කෙනා ඒක මැදින් පොඩි කඩ ඉරකින් බෙදලා ඒකෙ උඩ කොටසෙ වම් පැත්තට වෙන්න මේක ඇඳලා තියෙන්නෙ. එතකොට ගෙදර ගත්තම උඩ තට්ටුවේ වම් පැත්ත...... ඒ කියන්නෙ මේ හංගලා තියන දේ ඇත්තෙ පොත් ගුලේ වෙන්න ඇති.... " සිසිලි විජයග්‍රාහී ලෙස පැවසුවා ය.

"අන්න හොඳ නංගී..." අශේන් ප්‍රශංසාත්මකව ඇගේ හිසට තට්ටු කළේ ය. එනිසා එවර මුහුණ බෙරි වුණේ රෝශාන්ගේ ය.

"ඕහ් දැන් හවස් වෙලා  ගෙදර යන්න ඕනේ අම්මලා ඇවිත්ද දන්නෙත් නෑ .... හෙට උදෙන්ම මදූ අක්කට විස්තර කියන්නත් එපැයි.... අද නම් නින්ද යන්නෙත් නැතිවෙයි.." සිසිලි කීවා ය.

"ඔව් ඔව් දැන් යමු" මිතුරන් එකිනෙකා ගෙන් සමු ගත්තේ මහත් උද්යෝගයෙන් හා සතුටෙනි.

මීලඟට වන දේ සිදු වන තුරු ම  කුමක් දැයි කීමට කිවෙකුට නොහැකිය. අපේ මිතුරන් ද රාත්‍රීයේ සුවපහසු නින්දකට අවතීර්ණ වූයේ හෙට සිදු වන දේ නොදැන ය.

# 06

# සඟවා තිබූ දෙය

**ප**සු දිනයේ ඇන් අවදි වූයේ වෙන දා මෙන් කම්මැලිව නොව තමා අද කිරීමට යන දෙය පිළිබඳ සතුටිනි. උදෑසන අටට ද පෙර හොඳින් ලක ලෑහැස්ති වූ ඇය අනෙක් අයද සමගින් මදූ අක්කා ගේ නිවස වෙත ගියේ සිතේ ඇති වූ කැලඹීමත් ද සමඟිනි.

*        *        *        *        *        *

මදූ අක්කා විසින් මිතුරු කැල සාදරයෙන් පිළිගත්තාය. ළමුන්ගේ විස්තරය ඇසූ ඇය නොමඳ සතුටට පත් වූවා ය. “මම කවදාවත් හිතුවෙ නෑ මේ කතාව ඇත්ත එකක් කියලා ඔයාලා හොයා නොගත්ත නම් මම කවමදාකවත් ඒ ගැන විශ්වාස කරන්නෙත් නැහැ” මදූ අක්කා ඔවුන්ට කීවා ය.

“ඒයි!!! කවුද ඔය??” රොශාන් එක්වරම කෑගසමින් ජනේලය වෙත පැන්නේ ය. ජනේලයෙන් පිටත සැඟවී ඔවුන්ගේ කතාවට සවන්දීගෙන සිටි කිසියම් අයෙක් ඉවතට පැන වේගයෙන් දිව යන්නට විය.

“ඒ අර හොරුන්ගෙන් කෙනෙක් වෙන්න ඇති...” උදිත්ට කියවිණි. “ඔව් එයාට හැම දේම ඇහෙන්න ඇති.. ඒ කට්ටිය අද රෑත් එන්න ඉඩ තියනවා. අපි දැන්ම ම වැඩ පටන් ගනිමු. එන්න යමු... ” අශේන් මුල් තැන ගත්තේ ය.

"ඔව්, ඒක හොඳයි. ඒත් මම කැමති නැහැ ඔය ළමයි කරදර වෙනවට.." මදූ අක්කා කියා නිම කිරීමටද පෙර ඊට විරුද්ධව හඬවල් සයක් එක වර නැගුනි.

"හොඳයි ඔයාලගෙ කැමැත්තක්." ඇය අවසානයේ දී පැවසුවා ය.

ඔවුන් උඩු මහලට යාමට හදත්ම හදිස්සියේ නිවසේ දුරකථනය නාද වන්නට විය.

"මම ඒ ගැන බලන්නම්. ඔයාලා පොත් ගුලට යන්න." යි පැවසූ මදූ අක්කා දුරකථනය වෙත ගියා ය.

පොත් ගුලට පැමිණි පසු ඈන් තම සටහන් පොතේ ඇඳගත් සිතියම දිග හැරියා ය. "ඔහ් ඒකෙ තියෙන්නෙ රතු , කළු , නිල් පාට මල් තුනක් මැද රත්තරන් පාටින් ලිව්ව K J කියලා අකුරු දෙකක්. අපි කොහොමද දැන් එහෙම එකක් හොයන්නෙ....ඒ මදිවට කොළේ පුරාම කොටු ඇඳලා......" ඈන් දුර්මුඛ වූවා ය.

"එහෙම කියන්න එපා... හොඳ පැත්තත් හිතන්න, දැන් බලන්න, මේ සිතියමේ වගේ රත්තරන් පාටින් බිත්තියේ ලියලා තිබුණොත් අපිට හොයාගන්න ලේසියි...." රොශාන් කීය.

ඈන් එකට එක කීමට සැරසෙත් ම මදූ අක්කා එහි ආවා ය. ඇය කොහේ හෝ යෑමට සූදානම්ව සිටියා

"අර කෝල් එක ආවේ බැංකුවෙන්.. හදිස්සියේ පොඩි වැඩකට එන්නලු.. ඒ නිසා මම දැන් යනවා...ඔයාලට මහන්සිත් ඇතිනේ.. ටිකක් විවේක ගන්න. ඔයාලා කැමති කෑමකුත් හදලා තියනවා..." යැයි පැවසූ ඇය පිටව ගියා ය.

" ඔහ් කෑම...... හැබැයි මේ වැඩේ ඉවර කරලම හිටියා නම් හොඳයි... " යි කියමින් හේත්තු වී සිටි පොත් රාක්කය අසලින් ඉවතට ඒමට හැදූ උදිත් එලා තිබූ කලාලයේ පය පැ

කිළී බිම ඇද වැටුණි.. "අයියෝ..... බබා." කියමින් එතැනට ගිය අශේන් ඔහුව නැගිට්ටවීමට හැදුවද උදිත් ගල් ගැසුනාක් සේ එලෙස ම හිඳ ගෙන සිටියේ ය..

"ඇයි උදිත් මල්ලි ඔයාට තුවාල ද? " අශේන් විමසද්දී අනෙක් අය ද එතැනට රොක් වූහ.

"නෑ... ඒත් K J...... මම KJ ව හොයාගත්තා." ඔහු පොළවට ඇඟිල්ල දිගු කර හඬ නැඟීය. පොත් ගුල මැද අල්ලා තිබූ අනෙක් ගල්වලට වඩා පැරණි බවක් ඉසිලූ පාෂාණයක් මැද රතු , කළු , නිල් පැහැති මල් තුනකට මැදි වී KJ අකුරු දිළිසෙමින් තිබිණි.

එහෙත් එම සතුට වැඩි වේලාවක් නොපැවතුනේ සිසිලි හදිසියේ දුටු දසුනක් නිසා ය.

මදූ අක්කාගේ කාරය පිටව යන ශබ්දය ඇසුණෙන් ඇය ජනෙල් කවුළුවෙන් එබී බැලුවා ය. මදූ අක්කාගේ කාරය පසු පසින් කළු පැහැති කැබ් රථයක් හඹායනු ඇය දුටුවා ය. ඒ දුටු ඇයට කෑ ගැසුනි.

"දැන් මොකද කරන්නේ? ඒ කියන්නේ එයාලා දන්නවා මදූ අක්කා නෑ කියලා... ඒ නිසා එයාලා මෙහෙට එන්න පුළුවන්.... මම හිතන්නෙ එහෙනම් අර කෝල් එක දෙන්න ඇත්තෙත් එයාලමයි....." අශේන් කලබල විය.

"අපි මදූ අක්කව ආපහු එන්න ඕන" සිහින පැවසුවේ තීරණාත්මක හඬකිනි.

"කොහොමද?"

"මං දන්නවා... මම උඩ වත්ත පාරෙන් දුවගෙන ගිහින් එයාව නතර කරන්නම්." සිසිලි ඉදිරිපත් වූවා ය.

"මාත් එනවා" රොශාන් ද දුව ගෙන ආවේ ය.

*          *          *          *          *          *

"අපිට බල බල ඉන්න වෙලාවක් නෑ...උන් දැන් කොයි වෙලාවෙ හරි එයි.... "

"ඉක්මන් කරමු.."

අශේන් හා සිහින එක්ව එම ගල එතැනින් ඉවත් කළ පසු ඊට යටින් අඩි හයක පමණ විවරයක් සෑදී තිබුණි. "මම බැ හැලා බලන්නම්.."යැයි පැවසූ සිහින වළ තුළට බැස්සේ ය.

"මේක යට යකඩ පෙට්ටියක් තියනවා.. මම දුන්නම ගන්නවා.. "

සුළු මොහොතකට පසු සිහින විසින් ප්‍රමාණයෙන් මදක් විශාල යකඩ පෙට්ටියක් ඉහළට එසවූ අතර එය පසෙක තැබූ අනෙක් තිදෙන සිහිනට උඩට ඒමට උපකාර කළහ.

මෙතෙක් වේලාවක් එතැනට වී සිදුවන සියල්ල බලාසිටි දෙදෙනෙක් ළමුන් වෙතට ළඟා වූයේ ඔවුන්ට ද නොදැනී-- මය.

"බොහොම හොඳයි. දැන් ඕක මෙහාට දෙනවා.." එක් අයෙක් පවසා සිටියේ ඉතා දරුණු අන්දමිනි.

බලාපොරොත්තු නොවූ මෙම හදිසි කඩා වැදීම නිසා ළමුන් කලබල වූහ. ඇන් බියපත්ව කෑගැසුවා ය. උදිත් හා ඇන් පසුපසට තල්ලු කර දැමූ අශේන් හා සිහින ක්ෂණිකව යකඩ පෙට්ටිය ඩැහැගත්හ.

"අපි හිතුවට වඩා තමුන්ලා දක්ෂයි.... ඒ වුණත් වෙන කරන්න දෙයක් නෑ.. දැන් ඕක දෙනවද? නැද්ද?"

ඔවුන් කළු රෙදි කඩකින් මුහුණු ආවරණය කරගෙන සිටි නිසා ළමුන්ට ඔවුන්ගේ මුහුණු දැක ගැනීමට නොහැකි වුව ද එම මිනිසුන් දෙදෙනා ඉතා දරුණු බව වැටහිණි.

"ඇයි අපි ඒක ඔයාලට දෙන්නෙ අපිනෙ ඒක හොයා ගත්තේ ඒ නිසා දැන් මේක අපේ. " අශේන් එම පුද්ගලයාට කියා සිටියේ විනෝද්කාමී ස්වරයෙනි.

"මම තමුසෙලාට අද......."

"ඇයි අපිට මොනව කරන්නද ? " සිහින ද බිය සැක නැතිව විමසුවේය.

මම අද ලේසියකින් ඉතුරු කරන්නෙ නෑ.." යි ගෙරවූ ඔහු කබා සාක්කුවට අත දමා පිසතෝලයක් එළියට ගත්තේ ය. එහෙත් ඔහුට එය එසවීමටවත් අවස්ථාවක් නොතබා කටහඬක් ගිගුරුවේ ය.

"යටත් වෙනවා!"

එක්වර ම පොලිස් නිලධාරීන් පිරිසක් එතුළට කඩා වැදී මැරයන් දෙදෙනා සිර භාරයට ගත්හ.

ඊට පසු පසින් පො ත් ගුලට ඇතුලු වූයේ අන් කවරෙකුත් නොව මදූ අක්කාත් ඇයව කැඳවාගෙන පැමිණි සිසිලි හා රොශාන් යන දෙදෙනාය.

මදූ අක්කා සිටියේ ඉතා සතුටිනි. සිසිලි හා රොශාන් අතර මගදී ඇයව නවතා ගැනීමට සමත්ව තිබූ අතර ඉන් පසු ඔවුන් තිදෙනා හැකි ඉක්මනින් නිවසට පැමිණ ඇත. මැරයන් දෙදෙනා නිවසට ඇතුළු වනු දුටු ඔවුන් පොලීසියට ගොස් ඇත. පොලිස් නිලධාරීන් පැමිණ මිනිසුන් දෙදෙනා සිර භාරයට ගෙන ඇත්තේ ඒ අනුව ය.

* * * * * *

"අපිට මේක අමතක වෙලා ම ගියා නේ..... " පොලිස් නිලධාරීන් පිටව ගිය විගස ඔවුන් සූදානම් වූයේ යකඩ පෙට්ටිය ඇර බැලීමටයි.

එහි යතුරක් නොවූ බැවින් එයට කිහිප වරක් පහර දීමෙන් අනතුරුව අගුල ගැලවුණි. එනමුත් එහි පියන විවර කළ පසු ඔවුන්ගේ  බලාපොරොත්තු සුන් වුණේ එතුල තිබී හමුවූයේ ඔවුන් බලාපොරොත්තු වූ වස්තුව නොව  සාමාන්‍ය ප්‍රමාණයට වඩා විශාල පරණ පොතක් නිසාවෙනි.

"අම්... මම අහල තියන විදිහට ඉස්සර ඉඳන් අපේ පවුලේ හැමෝම පොත්වලට තමයි කැමති. ඒනිසා  එයාලා හිතන්න ඇති මේක වටිනා දෙයක් කියලා..." මදූ අක්කා ළමුන් සැනසුව ද ඇය ද විශාල බලාපොරොත්තු කඩ වීමකට ලක් වූවා ය.

එහෙත් ඇන් එම පොතේ පිට කවරෙහි වෙනසක් හඳුනා ගත්තා ය.

එය සාමාන්‍ය කවරයක් මෙන් කිහිප ගුණයක්   විශාල විය. පොත අතට ගත් ඇය වහා එය ගලවා දැම්මා ය. සියල්ලන් පුදුමයට පත් කරමින් මේසය මතට වැටුණේ දිළිසෙන තද රත් පැහැති යමකි. "රතු මැණිකක්!!" ඒ දෙස මොහොතක් ගල් ගැ සී බලාසිටි මදූ අක්කා ඇන්ව                වැළඳගත්තා ය.

සියල්ලන්ට ම සතුට නිම් හිම් නැති විය. මදූ අක්කා වහා තේ මේසයක් පිළියෙල කළා ය. ඇය ඒ අතරතුර සුවිසල් පො තේ සඳහන්ව තිබූ කතාව ඔවුන්ට කීවාය. එය ලියාඇත්තේ මිත්තණියගේ ද මිත්තණිය විසිනි. එකල ඉංග්‍රීසීන් විසින් ලංකාව යටත් කර ගෙන සිටි කාලයයි. ඇගේ මීමිත්තණිය එකල උසස් මට්ටමක තැනැත්තියකි. එනමුත් කලකට පසු ඉංග්‍රීසි ජාතිකයන් ඇගේ ධනය කොල්ලකනු     ලැබූ අතර අවසානයේ ඇය සතුවූ එකම වස්තූන් වූයේ මෙම පුස්තකයත් රතු මැණිකත් පමණි.

“අන්තිමට අවුරුදු ගාානකට පස්සේ ඒව ආායෙත් හො යා ගත්තෙ අපි කියලා දැනගත්තොත් එයා ගොඩක් සතුටු වෙයි..”

“නැතුව.. අපිට මේ පොතේ තියන දේවල් අපේ සා හිත්‍ය පුස්සකාලෙටත් උදව්වෙයි... මට ඒක අමතක වෙලා ගිහින් තිබ්බෙ...”

ඔව්, මමත් එහෙම හිතනවා.... මදූ අක්කාද කීවා ය.

“ඒ කොහොම උනත් අපිට අවසානය ගැන සතුටු වෙන්න පුළුවන්.”

“ඔ්ඔ්........මට තමයි වැඩියෙන් ම සතුටු!! මොකද, මම දැ න් අර එදා අයියා ගැන හැදුව කවිය කියන්න යන්නේ..” උදිත් ද පණ්ඩිත ලෙස කීය.

“කවුරු දනී ද ඔහු..........”යනුවෙන් උදිත් ගායනය අරඹත්ම “ඒයි මැට්ටා” යි කෑගසමින් රොශාන් ඔහු වෙත කඩා පැන්නේ ය. සතුටින් පසුවන නිදහස් ළමා පිරිසකගේ විනෝ දකාමී සිනාහඬ එම මොහොතේ වාතලය ඔස්සේ හිස් අවකා ශයට ඇදී ගියේ ය.

~ නිමි ~

# පසුවදන

නූතන තාක්ෂණික මෙවලම් භාවිතයට එකතුවීමත් සමග සිදුවන සමාජ ආර්ථික පරිවර්තනයන් හේතුකොටගෙන පොත පතින් දුරස්වන පාසල් දරුවන් නැවත පොත පතට සමීප කරවීම හරහා අධ්‍යාපනයේ ගුණාත්මක වර්ධනයක් ඇතිකිරීම ඔවුන්ගේ සාහිත්‍යය නිර්මාණ හැකියාවන් ඔප්නැංවීම තුළින් රටේ සාහිත්‍ය ප්‍රබෝධයක් ඇතිකිරීම වැනි බහුවිධ පරමාර්ථ ඇතිව 2014 වසරේ දී මා විසින් අධ්‍යාපන අමාත්‍යංශයට පෞද්ගලික යෝජනාවක් ලෙස පාසල් දරුවන් ග්‍රන්ථ කරණයට යොමුකරන ක්‍රියාමූලික පර්යේෂණ ව්‍යාපෘතිය හඳුන්වාදෙන ලදී. ඒ යටතේ වැඩි ම ග්‍රන්ථ ප්‍රමාණයක් රචනා කරමින් වාර්තාවක් තබන්නේ මහාමායා පුංචි ගත්කතුවරියන් ය. පාසල තුළ ගොඩනැගී ඇති ලේඛන සංස්කෘතිය නව මාවතකට යොමුකරමින් රටේ සෙසු පාසල් දරුවන් හා එක්ව මෙවර ජාත්‍යන්තර පාඨකයන් වෙත ලඟාවීමට නූතන තාක්ෂණය හා බැඳුණු විද්‍යුත් කෘති රචනා කරන්නට විය. ඒ තුළින් සම්පාදනය වූ මෙම විද්‍යුත් කෘතිය දරුවන්ට අත්දැකීම් සමුදායක් ලබාදෙමින් අධ්‍යාපනයේ ගුණාත්මක දියුණුවට ඉවහල්වන අතර ම ඔවුන්ගේ හැඟීම් දැනීම් නිර්මාණාත්මක හැකියාවන් ශාස්ත්‍රීය හික්මීම ප්‍රදර්ශනයකරන කැඩපතකි. මෙම නිර්මාණ රටේ අධ්‍යාපනයේ දිශානතිය මෙන්ම සමාජ ප්‍රගමනයට මගපෙන්වන නිසා ප්‍රතිපත්ති සම්පාදකයින් සහ සැළසුම්කරුවන්ට මෙන්ම සමාජයේ වගකිවයුතු පාර්ශවයන්ට ආලෝකයක් සපයයි. පාසල් මට්මින් ආරම්භකර ජාතික තලය දක්වා විවිධ අභියෝග මැද පැමිණි මෙම ව්‍යාපෘතියේ ජීවය වූයේ මහාමායා දියණියන් සහ පාසල් ප්‍රජාව බව ගෞරවයෙන් සිහිපත් කරමි.

“දිවිය දිනන විද්‍යුත් පොතක්” ව්‍යාපෘතියට මහාමායා දියණියන් සමග එක්ව විද්‍යුත් කෘතියක් රචනාකර ජනගතකරන්නට ඩිජිටල් වේදිකාවට පිවිසි ගත්කතු අංකුර ඔබට ලෝකය දිනන ගත්කතුවරයෙකු වීමට ශක්තිය ලැබේවායි පතමු . .

මෙයට
සෙනෙවිරත්න මහලේකම්
පාසල් දරුවන් ග්‍රන්ථකරණයට යොමුකළ ව්‍යාපෘතියේ නිර්මාපක
2023 . 11 . 01